## 241 අණ බෙර ගසා

අණ බෙර ගසා හොරණෑ පිඹ ලොව පුබුදු කළා
මහ ජනතා රැස්වෙන තැන් සොයා බැලුවා
ජන පැසසුම් ලැබ ගන්නට තම නම උදෙසා
දුගින් හට දන් දුන්නත් පලක් නොවූවා

රහසින් දකිනා දේව පියාණෝ
මා වංචා කරුවෙකු බව හොඳ හැටි දන්නෝ
විපාක ලෙස මා දඬුවම් ලැබුවෝ
කවදත් කොතැනත් මා හට ගැරහුම්

දණින් වැටී දෑත් ඔසවා මොර හඬ නගලා
ජනයා හට පෙනෙන ලෙසින් දෙවිඳු පැසසුවා
වීදි වලදී දෙව් විමනේදී මුල් තැන ගත්තා
නමුත් සමිඳෙ ඔබ ඉදිරියෙ කිසිත් නොවූවා

විශාල කොට කඳිමෙට බැඳ පඬුරු ගෙනාවා
පූදසුන වෙත පා නැඟුමට මුලින්ම සිටියා
වංචාවත් කුහකකමත් සිතේ ඇති නිසා
ගෙනා පඬුරු පිදුවත් මට පලක් නොවූවා